# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,452 — 2006 ජූනි 30 වැනි සිකුරාදා — 2006.06.30

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 780 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 792 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූලි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජූනි මස 23 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සැම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිළධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තාහ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලෙස රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිළධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිළධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුත්තාහ.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිළධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථාද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරීවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත් වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලිම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිණු ලැබූ යුද්ධ, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවල යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

5. යුද්ධ සේවා අනුග්‍රහය :

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින්ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම්ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නා වූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙහි අර්ථ දැක්වීම :

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90 (1) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකෙරෙනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් වි භාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට වි භාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවි ය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### ආධුනික පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ, ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ/බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, දෙවන මහල, නව මහලේකම් ගොඩනැගිල්ල, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින්, ඔබ අයදුම් කරනුයේ " පොලිස් කොස්තාපල් තනතුර" යනුවෙන් සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2006.07.31 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

(අ) පොලිස් කොස්තාපල් තනතුර .–
රු. 1,66,560 - 7 x 1,440 - 27 x 1,800 - රු. 2,25,240.

(ආ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඇ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඈ) රාජකාරි සඳහා ගමන් වියදම්, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව.- ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතුය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්.–*
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුලුව එකවර විෂයයන් 06කින් සමත් විය යුතුය.

*සටහන 01.–* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41 සහ 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයක් වශයෙන් ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02.–* අ.පො.ස. (සා.පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද, එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.–* වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා.පෙළ) විෂයය ධාරාවට ඇතුලත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්.–*

* උස : අඩි 05යි අඟල් 04 (අවම)
* පපුව අඟල් 30යි (අවම/හුස්ම නාල්ලා)

*සටහන.–* විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩා වලදී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරඟයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුවද, අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්.–* එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයකු උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙක් සුදුසුකම්.–*

* අයදුම්කරුවන් අවිවාහක විය යුතුය. (දික්කසාද වුවත්ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.)අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාල නොවේ.)

* ඉහත දැක්වෙන මූලික අධ්‍යාපන හා ශාරීරික සුදුසුකම් ඇත්තාවූ ද, නියමිත වයස් සීමාව තුළ සිටින්නාවූද, අයදුම්කරුවන් වෙත ක්‍රීඩා හා වෙනත් විශේෂ දක්ෂතා වේ නම් ඔවුන් පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

* අවසාන තේරීම් මණ්ඩලයට ඉදිරිපත් වීමට ප්‍රථම අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණය, ඔරොත්තුදීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීමේ පරීක්ෂණය සහ ලිඛිත පරීක්ෂණයෙන් අයදුම්කරුවන් සමත් විය යුතුය. ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම් -

* වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය– කාලය විනාඩි 45 යි.

* සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය –කාලය පැය 01 යි.

* තෝරා ගන්නා ලබන අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. පොලිස් සේවයට නුසුදුස්සන් යැයි පිළිගනු ලබන්නවුන් බඳවා ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. *පත්වීමේ කොන්දේසි* :

* මෙම තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් ඇත.

* පත්වීමේ දින සිට මාසික ඉපයීම් වලින් 8%ක් දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ය.

* සියලුම නිලධාරින් දෙපාර්තමේන්තු අරමුදල් වලට දායක විය යුතුය.

06. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවෙනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරී කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවළුන්ද සේවයේ ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ වසරක 01ක් ද, ප්‍රාදේශීය පුහුණුව වසර 02ක් ද වනු ඇත.

(ඊ) පත්කර ගනු ලැබූ නිලධාරින් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුවද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* **II** අංක 41 දරන නිවේදනය අනුව, අවම වශයෙන් අවුරුදු 02ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්ට විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(උ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කල යුතු අතර මෙම සේවා කාලය අවසන් වීමට ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිළ ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාරදෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි I වන වෙළුමෙහි ආයතන සංග්‍රහයේ පළමුවෙනි වෙලුමේ, 05 වෙනි පරිච්ඡේදයේ, වගන්ති 04ට අනුකූල විය යුතුය.

(ඌ) පොලිස් කොස්තාපල්වරුන් පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(එ) පොලිස් කොස්තාපල්වරුන් පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(ඒ) පොලිස් කොස්තාපල්වරුන් පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

07. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛන වල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.)

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක්. (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂයය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික. (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

09. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කල යුතුය.

(ආ) අයදුම්කරු විසින් අයදුම්පත් අහල් 11x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරු වලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාල සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

10. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.–* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

චන්ද්‍රා ප්‍රනාන්දු,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**පොලිස් දෙපාර්තමේන්තුව**

*ආධුනික පොලිස් කොස්තාපල් තනතුර*

01. සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය. :————.

02. ඔබ අයදුම්කරන්නේ විශේෂ කාර්ය බලකායේ පොලිස් කොස්තාපල් තනතුර සඳහාද? :————.

03. නම (මුලකුරු සමඟ) :————.

04. ජාතික හැඳුනම්පත් අංකය :————.

05. පියාගේ සම්පූර්ණ නම :————.

06. (අ) අයදුම්කරු උපන් ස්ථානය :————.

(ආ) උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :————.

07. (අ) වර්තමාන ලිපිනය :————.

(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.

(ඇ) ස්ථිර ලිපිනය :————.

(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :————.

08. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වුයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න.) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය : ————.

* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

09 උපන් දිනය :......... (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)
(*ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස) :
අවුරුදු :————. මාස :————. දින :————.

10. උස: අඩි :————. පපුව අඟල් :————.

11. අධ්‍යාපන සුදුසුකම් (සමත්වී ඇති විභාගයන් සඳහන් කර සහතික වල පිටපත් ඇමිණිය යුතුය.) :————.

12. විවාහක/අවිවාහක බව :————.

13. (අ) දැනට කරන රැකියාව :————.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? : ————.

14. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේද ?:

15. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ————.
(ආ) ————.

16. (අ) ඔබ පොලිස් උප සේවයේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේද ? (එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.) :—————.

(ආ) ඔබ මීට පෙර පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේද ? :————.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

17. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාල හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත්ද ? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

18. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේද ? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

19. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න.) :————.

20 .ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේද ? එසේම කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත් කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවකදී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත්වන බව දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

06-823/1

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### කාන්තා පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ, කාන්තා පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ/බඳවා ගැනීම්, ආධුනිකයන් බඳවා ගන්නා කාර්යාලය, දෙවන මහල, නව මහලේකම් ගොඩනැගිල්ල, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින්, " කාන්තා පොලිස් කොස්තාපල් තනතුර " යනුවෙන් සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2006.07.31. දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

(අ) කාන්තා පොලිස් කොස්තාපල් තනතුර .–
රු. 1,66,560 - 7 x 1,440 - 27 x 1,800 - රු. 2,25,240.

(ආ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඇ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඈ) රාජකාරි සඳහා ගමන් වියදම්, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසකම්* :

(අ) *වයස් සීමාව.- ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතුය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්.–*
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුලුව එකවර විෂයයන් 06කින් සමත් විය යුතුය.

*සටහන 01.–* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41 සහ 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයක් වශයෙන් ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02.–* අ.පො.ස. (සා.පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද, එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.–* වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා.පෙළ) විෂයය ධාරාවට ඇතුලත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්.–*

උස : අඩි 05යි අඟල් 02 (අවම)

*සටහන.–* විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩා වලදී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරඟයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කාරියෙකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුවද, අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්.–* එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂිකාවක් උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙක් සුදුසුකම්.–*

අයදුම්කාරිය අවිවාහක විය යුතුය. (දික්කසාද වුවන්ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.)අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරිනියන්ට මෙම කොන්දේසිය පමණක් අදාල නොවේ.

ඉහත දැක්වෙන මූලික අධ්‍යාපන හා ශාරීරික සුදුසුකම් ඇත්තාවූ ද, නියමිත වයස් සීමාව තුළ සිටින්නාවූද, අයදුම්කාරියන් වෙත ක්‍රීඩා හා වෙනත් විශේෂ දස්කම් වේ නම් ඔවුන් පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

අවසාන තේරීම් මණ්ඩලයට ඉදිරිපත් වීමට ප්‍රථම අයදුම්කාරිය සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණය, ඔරොත්තුදීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීමේ පරීක්ෂණය සහ ලිඛිත පරීක්ෂණයෙන් අයදුම්කාරියන් සමත් විය යුතුය. ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම් -

වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය – කාලය විනාඩි 45 යි.

සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය – කාලය පැය 01 යි.

තෝරා ගන්නා ලබන අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. පොලිස් සේවයට නුසුදුස්සන් යැයි පිළිගනු ලබන්නවුන් බඳවා ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. *පත්වීමේ කොන්දේසි* :

* මෙම තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් ඇත.
* පත්වීමේ දින සිට මාසික ඉපයීම් වලින් 8%ක් දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ය.
* සියලුම නිලධාරිනියන් දෙපාර්තමේන්තු අරමුදල් වලට දායක විය යුතුය.

06. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුන් ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවෙනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිළධාරිනියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරී කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවළුන්ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ වසරක 01ක් ද, ප්‍රාදේශීය පුහුණුව වසර 02ක් ද වනු ඇත.

(ඊ) පත්කර ගනු ලැබූ නිළධාරිනියන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුවද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් **II** අංක 41 දරන නිවේදනය අනුව, අවම වශයෙන් අවුරුදු 02ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරිනියන්ට විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(උ) අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කල යුතු අතර මෙම සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඇයගේ පුහුණුව සඳහා නිළ ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාරදෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් වසර 1985 හි ආයතන සංග්‍රහයේ පළමුවෙනි වෙලුමේ, 05 වෙනි පරිච්ඡේදයේ, වගන්ති 04 ට අනුකූල විය යුතුය.

(ඌ) කාන්තා පොලිස් කොස්තාපල්වරියන් පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥාව/දිවුරුම් දිය යුතුය.

(එ) කාන්තා පොලිස් කොස්තාපල්වරියන් පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(ඒ) කාන්තා පොලිස් කොස්තාපල්වරියන් පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

07. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

;



08. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක්. (ඥාතීන් නොවන) ;

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික. ;

(ඈ) විශේෂ චාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂයය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික ;

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්) ;

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

09. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතුය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත් අඟල් 11x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරු වලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාල සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිළධාරියෙකු වෙත පෞද්ගලිකව භාර නොදිය යුතුය.

10. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.–* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

චන්ද්‍රා ප්‍රනාන්දු,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

## පොලිස් දෙපාර්තමේන්තුව

### *කාන්තා පොලිස් කොස්තාපල් තනතුර*

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය. :————.

02. නම (මුලකුරු සමඟ) :————.

03. ජාතික හැඳුනම්පත් අංකය :————.

04 පියාගේ සම්පූර්ණ නම :————.

05. *(අ)* අයදුම්කාරිය උපන් ස්ථානය :————.

*(ආ)* උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :————.

06. *(අ)* වර්තමාන ලිපිනය :————.

*(ආ)* වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.

*(ඇ)* ස්ථිර ලිපිනය :————.

*(ඈ)* ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :————.

07. *(අ)* ජාතිය :————.

*(ආ)* ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න.) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.

- * අයදුම්කාරිය :————.
- * අයදුම්කාරියගේ පියා :————.
- * අයදුම්කාරියගේ පිය පක්ෂයේ මුත්තා :————.
- * අයදුම්කාරියගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

08. උපන් දිනය : (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය)
(ගැසට් නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

09. උස: අඩි :————. අඟල් :————.

10. අධ්‍යාපන සුදුසුකම් (සමත්වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

11. විවාහක/අවිවාහක බව :————.

12. *(අ)* දැනට කරන රැකියාව :————.
*(ආ)* ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකාවක් ද ? : ————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේද ? :————.

14. අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
*(අ)* ————.
*(ආ)* ————.

15. *(අ)* ඔබ පොලිස් උප සේවයේ හෝ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේද ? (එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.) :————.

*(ආ)* ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේද ? :————.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. *(අ)*ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාල හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය :———.

*(ආ)* ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත්ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

17. *(අ)* ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

*(ආ)* ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

18. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න.) :————.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේද ? එසේම කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :– ———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත් කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත්වන බව දනිමි.

————.
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

06-823/2

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### ආධුනික පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ, ආධුනික පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයන් බඳවා ගන්නා කාර්යාලය, දෙවන මහල, නව මහලේකම් ගොඩනැගිල්ල, කොළඹ 01 යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින්, " පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර" යනුවෙන් සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2006.07.31. දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

පොලිස් කොස්තාපල් රියැදුරු තනතුර .–
රු. 1,66,560 - 7 x 1,440 - 27 x 1,800 - රු. 2,25,240

*(අ)* සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

*(ආ)* තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

*(ඇ)* රාජකාරි සඳහා ගමන් වියදම්, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

*(අ) වයස් සීමාව.- ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 19-26 ත් අතර විය යුතුය.

04.1 *(ආ) අධ්‍යාපන සුදුසුකම්.–*
අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුලුව එකවර විෂයයන් 06කින් සමත් විය යුතුය.

*සටහන 01.–* ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් වශයෙන් ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02.–* අ.පො.ස. (සා.පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද, එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.–* වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා.පෙළ) විෂයය ධාරාවට ඇතුලත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.

4.2 *(ඇ) ශාරීරික සුදුසුකම්.–*

* උස : අඩි 05යි අඟල් 03 (අවම)
* පපුව : අඟල් 30යි (අවම/හුස්ම නාල්ලා)

*සටහන.–* විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවලදී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගී වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුව ද, අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

*(ඇ) දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්.–* එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයකු උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

4.3 *(ඉ) වෘත්තීය සුදුසුකම්.–*

(1) *සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම*
(2) *ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 01ක මෝටර් රථ පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.*

*සටහන.– මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අලුත්වැඩියාව පිළිබඳ පළපුරුද්ද, රිය පැදවීම දිගු කාලීන පළපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.*

*(ඊ) අනෙක් සුදුසුකම්.–*

අයදුම්කරුවන් අවිවාහක විය යුතුය. (දික්කසාද වුවත්ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.)අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන නිළධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාල නොවේ.

රිය පැදවීමේ දක්ෂතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙළෙන කිසියම් අපේක්ෂකයෙකු වෙතොත් එම අපේක්ෂකයා සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.

මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන් වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අපේක්ෂකයන් ලබා ඇති දැනුමත්, එක් එක් අපේක්ෂකයා පැදවීමට නිපුණත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමක් පරීක්ෂා කරනු ලැබේ.

තෝරා ගනු ලබන අයදුම්කරුවන් පත්වීම ලැබීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. පොලිස් සේවයට නුසුදුසු වන අයදුම්කරුවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අවසාන තේරීම් මණ්ඩලයට ඉදිරිපත් වීමට ප්‍රථම අයදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීමේ පරීක්ෂණය සහ වෘත්තීය පරීක්ෂණය යන පරීක්ෂණයන්ගෙන් අයදුම්කරුවන් සමත් විය යුතුය.

* වෘත්තීය පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු පරීක්ෂාවට භාජනය කෙරේ.

*(අ)* රිය පැදවීමේ ප්‍රවීනතාවය ;
*(ආ)* මාර්ග නීති උපදේශක සංග්‍රහය ;
*(ඇ)* වාහන නඩත්තු කිරීම සහ සුළු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනීම

05. *පත්වීමේ කොන්දේසි* :

* මෙම තනතුර ස්ථිරය. දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් ඇත.

* පත්වීමේ දින සිට මාසික ඉපයීම් වලින් 8%ක් දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු ය.

* සියලුම නිලධාරීන් දෙපාර්තමේන්තු අරමුදල් වලට දායක විය යුතුය.

06. *සේවා කොන්දේසි* :

*(අ)* පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

*(ආ)* තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

*(ඇ)* ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවෙනි සහ දෙවෙනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

*(ඈ)* තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිළධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරී කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවළුන්ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

*(ඉ)* මූලික පුහුණුව ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ වසර 01ක් ද, ප්‍රාදේශීය පුහුණුව වසර 02ක් ද වනු ඇත.

*(ඊ)* පත්කර ගනු ලැබූ නිළධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුවද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් 11 අංක 41 දරන නිවේදනය අනුව, අවම වශයෙන් අවුරුදු 02ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරීන්ට විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

*(උ)* අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කල අතර මෙම සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිළ ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය භාරදෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ

ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාරගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වන වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 05 වන පරිච්ඡේදයේ, වගන්ති 04ට අනුකූල විය යුතුය.

*(උ)* පොලිස් කොස්තාපල් රියැදුරුවරුන් පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කල වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥාව දිවුරුම් දිය යුතුය.

*(එ)* පොලිස් කොස්තාපල් රියැදුරුවරුන් පොලිස් අභ්‍යාස විද්‍යාලයේ පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

*(ඒ)* පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

07. *(අ)* මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි බලපානු ඇත.

*(ආ)* 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

08. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛන වල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.)

*(අ)* උප්පැන්න සහතිකය ;

*(ආ)* චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක්. (ඥාතීන් නොවන) ;

*(ඇ)* අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික ;

*(ඈ)* විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂයය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික ;

*(ඉ)* සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික. (තිබේ නම් පමණක්) ;

*(ඊ)* ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

09. *(අ)* දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කල යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කල යුතුය.

*(ආ)* අයදුම්කරු විසින් අයදුම්පත් අහල් 11x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරු වලින්ම සම්පූර්ණ කරනු ලැබූ අදාල සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

10. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.–* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

චන්ද්‍රා ප්‍රනාන්දු,
පොලිස්පති.

### පොලිස් දෙපාර්තමේන්තුව

### *ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර*

*ආදර්ශ අයදුම්පත්‍රය*

01. සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය. :————.

02. නම (මුලකුරු සමඟ) :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය :————.

04. පියාගේ සම්පූර්ණ නම :————.

05. *(අ)* අයදුම්කරු උපන් ස්ථානය :————.

*(ආ)* උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :————.

06. *(අ)* වර්තමාන ලිපිනය :————.

*(ආ)* වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.

*(ඇ)* ස්ථිර ලිපිනය :————.

(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :————.

07. *(අ)* ජාතිය :————.

*(ආ)* ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න.) :————.

*(ඇ)* ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය : ————.

* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

08 උපන් දිනය : (උප්පැන්න සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය).–

09. (*ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස) :
අවුරුදු :————. මාස :————. දින :————.

10. උස: අඩි :————. පපුව : අඟල් :————.

11. අධ්‍යාපන සුදුසුකම් (සමත්වී ඇති විභාගයන් සඳහන් කර සහතික වල පිටපත් ඇමිණිය යුතුය.) :————.

12. විවාහක/අවිවාහක බව :————.

13. *(අ)* දැනට කරන රැකියාව :————.
*(ආ)* ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? : ————.

14. *(අ)* රියදුරු බලපත්‍ර අංකය සහ එය නිකුත් කළ දිනය ? :————.
*(ආ)* කවර වාහන පැදවීම සඳහා ඔබට ප්‍රවීනතාවය ඇති බවට සහතික කර තිබේ ද ?
*(ඇ)* බස් හා ලොරි වැනි බර වාහන පැදවීම සඳහා සහතිකය දීර්ඝ කර තිබේද ? එසේ නම් කවර දිනක සිට ද ?

15. අයදුම්කරුගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :—
*(අ)* ————.
*(ආ)* ————.

16. ඔබ කවදා හෝ රජය යටතේ සේවය කර තිබේද ? එසේ නම් ඔබ විසින් කරන ලද රැකියාව පිළිබඳ කාලය, දෙපාර්තමේන්තුව, තනතුරු සහ අදාල විස්තරත්, ඔබ එම දෙපාර්තමේන්තුවෙන් අස් වූයේ කවර හේතූන් නිසාද යන වගත්, සවිස්තරව සඳහන් කරන්න.

.17 *(අ)* ශ්‍රී ලංකා පොලීසියේ රියදුරු හෝ කොස්තාපල් තනතුරක් සඳහා ඔබ මීට පෙර ඉල්ලුම් කර තිබේද ? එසේ නම්, යොමු අංකය සඳහන් කරන්න :————.

*(ආ)* මීට පෙර ඔබ පොලිස් සේවයේ නියුතුව සිටියේ ද? (නිල අංකය සඳහන් කරන්න) එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

18. *(අ)* ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාල හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය (නිළ අංකය සඳහන් කරන්න) :———.

*(ආ)* ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත්ද ? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න.(නිළ අංකය සඳහන් කරන්න) :————.

19 (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.(නිළ අංකය සඳහන් කරන්න) :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න (නිළ අංකය සඳහන් කරන්න):————.

20. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න.) :————.

21. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේද ? එසේම කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත් කරගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත්වන බව දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

06-823/3

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද්දකි)

ශ්‍රී ලංකා මුද්‍රණ හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට අදාළ පාඨමාලා හඳුන්වාදීමේ අද්විතීය ස්ථානයක් ලබා සිටින ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එම ක්ෂේත්‍රයන්ට අදාළ දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැප වී කටයුතු කරයි. මෙම ආයතනය මගින් පහත සඳහන් පාඨමාලා අලුතින් හඳුන්වා දෙයි :

1. ද්විමාන හා ත්‍රිමාන සජීවිකරණය පිළිබඳ සහතික පත්‍රමාලාව
(Certificate Course in Digital Animation)
ද්විමාන හා ත්‍රිමාන සජීවිකරණය පිළිබඳ උනන්දුවක් දක්වන නවකයන් සඳහා මෙන්ම එම ක්ෂේත්‍රයන්හි රැකියාවල නියුතු පුද්ගලයන්ට ද සරිලන අයුරින් මෙම පාඨමාලාව සකස් කර ඇත. පාඨමාලා කාලය මාස 06 ක් වන අතර සතියකට වරක් පංති පැවැත්වේ.

මෙම පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන අතර අත්‍යවශ්‍ය අවස්ථාවන්හි දී ඉංග්‍රීසි මාධ්‍යය භාවිතා කෙරේ.

ප්‍රධාන පාඨමාලා අන්තර්ගතය:

**Moho**
- Introduction
- Interface Reference
- Introduction Layer Types
- Tool
- Animation
- Rendering

**3ds Max**
- Project Work Flow
- Using Materials
- Placing Lights and Cameras
- Animation
- Modifiers
- Rendering

**Maya 7**
General
Modeling
Animation, Character Setup and Deformers
Dynamics and Simulation
Rendering and Render Setup

2. මුද්‍රණය හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයේ නියැලි නිලධාරීන්ට පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකළස් කිරීම පිළිබඳ සහතිකපත්‍ර මාලාව
(Certificate Course in Computer Hardware and PC Assembly for Graphic Arts Industry)

ග්‍රැෆික්ස් සහ මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන් මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුලත්වීමට අදහස් කරන නවකයන්ට පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳ මනා අවබෝධයක් සහ දැනුමක් ලබා දීමේ අරමුණින් මෙම පාඨමාලාව හඳුන්වා දෙයි. මේ තුළින් පරිගණක දෘඩාංග සහ මෘදුකාංගවල එදිනෙදා පැන නගින ගැටළුවලට අමතරව පරිගණකවල පැන නගින අනෙකුත් සාමාන්‍ය ප්‍රශ්න විසඳා ගන්නා අයුරුද මැනවින් පහදා දෙයි. මාස 2 1/2 ක කාලයක් තුළ පැවැත්වෙන මෙම පාඨමාලාව සති අන්ත දිනවලදී පංති පැවැත්වේ.

මෙම පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන අතර අත්‍යවශ්‍ය අවස්ථාවන්හි දී ඉංග්‍රීසි මාධ්‍යය භාවිතා කෙරේ.

*ප්‍රධාන පාඨමාලා අන්තර්ගතය* :
Introduction to Computers
Hardware and Software
Components of a Computer System
Installation of software/drivers
Computer Networking
PC Assembly
General Trouble Shooting

3. මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍ර සඳහා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
(Certificate Course in English Language for Graphic Arts Industry)

මුද්‍රණ හා ග්‍රැෆික් ක්ෂේත්‍රවල නියැළි අයට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුලත්වීමට අදහස් කරන නවකයන්ටත් තමන්ගේ වෘත්තීමය සහ පුද්ගලික කරුණුවලට අදාළ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ හසල දැනුමක් ලබා දීම උදෙසා විශේෂයෙන් සැළසුම් කර ඇත. අදියර තුනකින් පැවැත්වෙන මෙම පාඨමාලාවට කථාව, ව්‍යාකරණ, වචන මාලා වර්ධනය, දෙබස්, කියවීම, සවන්දීම සහ ලිවීම අන්තර්ගත වේ. පාඨමාලා කාලය මාස 04 කට සීමාවන අතර සතියකට දෙවරක් පංති පැවැත්වේ.

*ප්‍රධාන පාඨමාලා අන්තර්ගතය* :
Basic Level
Elementary Level
Intermediate Level
Special Features
Practical - English Language usage in the industry enviornment.

මෙම පාඨමාලාවලට ඇතුළ්වීමට ඇති ඉඩකඩ සීමාසහිත නිසා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව තෝරාගනු ලබන අපේක්ෂකයන්ට පමණක් මෙම පාඨමාලාවන් හැදෑරීමට අවස්ථාව සැලසේ. පාඨමාලාව සාර්ථකව නිම කරන සිසුන්ට රජය පිළිගත් සහතිකයක් ප්‍රදානය කෙරේ.

විමසීම් - ලේඛකාධිකාරී හෝ පාඨමාලා අධ්‍යක්ෂ, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, බොරැල්ල, කොළඹ 08.

දුරකථන අංක : 2686162/2679791
ෆැක්ස් - 2686162
ඊමේල් - sliopreg@sltnet.lk

06-712

B2 -B 079277

**ගුරු අධ්‍යාපනය පිළිබඳ පූර්ව සේවා වෘත්තිය පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2007**

2006.05.26 වන දින *ගැසට්* නිවේදනයේ වගන්ති සංශෝධනය කිරීම

සංශෝධන 1– මූලික අධ්‍යාපන සුදුසුකම් යටතේ 3.4 ඡේදය :
"ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පාඨමාලාවලට ඉල්ලුම් කරන්නේ නම් 2000 වර්ෂය හෝ ඊට පෙර අ. පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයට සම්මාන සාමාර්ථයක් හෝ 2000 වර්ෂයට පසු අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට අධි සම්මාන/ඉංග්‍රීසි සාහිත්‍ය විෂයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම" ලෙසත්,

සංශෝධන 2 - අයදුම්පත් පිළියෙල කිරීම සඳහා උපදෙස් යටතේ පළමු ඡේදය :
"*ගැසට්* නිවේදනය කීප වරක් සැලකිල්ලෙන් කියවන්න. ඔබට සුදුසුකම් ඇති පාඨමාලා තුනකට එක් අයදුම් පත්‍රයක පමණක් අයදුම් කරන්න. පහත දැක්වෙන ආදර්ශය අනුව ඒ 4 ප්‍රමාණයේ (සෙන්ටිමීටර 21 x 29.7) සුදු කඩදාසියක අයදුම්පත පිළියෙල කරන්න. 1.0-10.3 දක්වා ඡේද පළමුවන පිටුවට ඇතුළත් වන සේ සකස් කරන්න. කොටුවක් තුළ තොරතුරු දැක්විය යුතු අවස්ථාවලදී අදාළ කොටුව තුළ "X" ලකුණ යොදන්න. ලෙසත්,

සංශෝධන 3 - ආදර්ශ අයදුම් පත්‍රයෙහි 6.2 ඡේදය :
2007.01.01 දිනට වයස ලෙසත්,

සංශෝධන 4- උක්ත *ගැසට්* නිවේදනයේ දෙමළ මාධ්‍ය නිවේදනයේ 4.9 පාඨමාලා අංක 9 ඉස්ලාම් ධර්මය යටතේ

ආ ඡේදය :
4.9.1, 4.9.5 සහ 4.9.3 සහ 4.9.4 සහතික හිමි අයදුම්කරුවන් ලෙසත්,
ඉල්ලුම් පත්‍ර කැඳවීමේ අවසාන දිනය 2006.07.17 දින ලෙසත් සංශෝධනය කරනු ලැබේ.

ආරියරත්න හේවගේ,
ලේකම්.

2006 ජූනි මස 15 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
බත්තරමුල්ල.

06-793

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.